සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 8 - 2019

නම : .............................................. පුරවැසි අධ්‍යාපනය කාලය : පැය 02 යි.

වැදගත් :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරැදි පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියා දක්වන්න.**

(1) පොදු සේවා විධිමත්ව ප්‍රයෝජනයට ගැනීම පුද්ගල සංවර්ධනයට මෙන්ම .............................................................................. හේතු වේ. (ගුණාත්මක සංවර්ධනයට, ජාතික සංවර්ධනයට, ආගමික සංවර්ධනයට)

(2) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව, වයස ...................................................... සම්පූර්ණ කළ පුද්ගලයෝ ළමයින් ලෙස පිළිගැනෙති. (අවුරුදු 16/ අවුරුදු 14/ අවුරුදු 18)

(3) මිනිසා සාමූහිකව කටයුතු කරන සෑම අවස්ථාවකම ඔහු මෙහෙයවීම සඳහා ...................................................... අවශ්‍ය වේ. (නායකයෙකු, අනුගාමිකයෙකු, මඟ පෙන්වන්නෙකු)

(4) ගැටලු විසඳීමේ දී එය විශ්ලේෂණය කර ...................................................... කටයුතු කිරීම වැදගත් වේ. (ආචාරශීලීව, අවිචාරශීලීව, නිර්මාණශීලීව)

(5) තමන් කරන කාර්යය සතුටින් හා කැමැත්තෙන් යුතුව ඉටු කිරීම ...................................................... නම් වේ. (ආත්මාභිමානය, ශ්‍රමාභිමානය, කාර්යක්ෂමතාවය)

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(6) ශ්‍රී ලංකාවේ ළදරු මරණ සංඛ්‍යාව සහ මාතෘ මරණ සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතී. ( )

(7) අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට බාධා නොවන අයුරින් වත්මන් පරපුරේ අවශ්‍යතා ඉටු කර ගැනීම තිරසාර සංවර්ධනය වේ. ( )

(8) පවත්නා තත්ත්වය හා තමා අපේක්ෂා කරන දෙය එලෙසින් ම ඉටු කරගැනීමට නොහැකි වීම අතර ඇති වෙනස ගැටලුවක් ලෙස දැක්විය හැකිය. ( )

(9) ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් මිස ජීවන ක්‍රමයක් නොවේ. ( )

(10) වැඩ ලෝකය යනු අපගේ පැවැත්මට අවශ්‍ය කාර්යයන් හා සේවා සපයන සියලුම අංශ වේ. ( )

- **අංක 11 15 දක්වා ප්‍රශ්නවලට නිවැරැදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) ඕනෑම සමාජයක් මෙහෙයවන ප්‍රධාන බලවේගය වන්නේ මින් කුමක් ද?

1. පවුලයි. 2. සංස්කෘතියයි. 3. ආගමයි. 4. පාසලයි.

(12) පෘථිවි අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලියක් නිසා ඇති වන ස්වාභාවික විපතක් වන්නේ මින් කුමක් ද?

1. කුණාටු 2. සුළි සුළං 3. සුනාමි 4. එල්නිනෝ

(13) ජාතික ආරක්ෂාව පිළිබඳ මෙහෙයුම් මධ්‍යස්ථානයේ දුරකථන අංකය පහත පිළිතුරුවලින් තෝරන්න.

1. 110 2. 119 3. 559 4. 118

(14) පාරම්පරිකව පැවත එන රැකියාවක් වන පිත්තල බඩු කර්මාන්තය සඳහා ශ්‍රී ලංකාවේ නමක් දිනාගෙන ඇත්තේ,

1. මොළගොඩ ය. 2. පිළිමතලාව ය.
3. අම්බලන්ගොඩ ය. 4. ගාල්ල ය.

(15) පුද්ගලයෙක් යම් රැකියාවකට ඉල්ලුම් කිරීමේ දී මුලින්ම සැලකිල්ලට ගනු ලබන සාධකය පහත පිළිතුරුවලින් තෝරන්න.

1. වැටුපයි. 2. ස්ථානයයි.
3. රැකියාවේ ස්වභාවයයි. 4. සමාජයේ ඇති පිළිගැනීමයි.

- **A කොටසින් දැක්වෙන සේවාව සපයන නිලධාරියා B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| (16) | දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටලු විමර්ශනයට සහාය ලබාදීම. | 1. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි තුමා |
| (17) | ළමයින් හා කාන්තාවන් සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් ලබා දීම. | 2. සමාජ සේවා නිලධාරි තුමා |
| (18) | දරුවන්ට අදාළ වන පරිදි රජයේ විශේෂ සමාජ සුභසාධන සේවාවන් ලබාදීම. | 3. ළමා හා වනිතා කටයුතු අමාත්‍යංශයේ උපදේශන නිලධාරි තුමා |
| (19) | පෙරපාසල් අධ්‍යාපනය හා මුල් ළමාවිය සංවර්ධනය සඳහා අදාළ සේවාවන් ලබාදීම. | 4. ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි තුමා |
| (20) | දරුවන්ගේ අයිතිවාසිකම් හා ඔවුන්ට අදාළ සේවාවන් සඳහා සම්බන්ධීකරණ කටයුතු කිරීම. | 5. මුල් ළමාවිය සංවර්ධන නිලධාරි තුමා |

(ලකුණු $02 \times 20 = 40$)

# II කොටස

වැදගත් ඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

A 

B 

C 

D 

(i) ඉහත රූප සටහන් හොඳින් නිරීක්ෂණය කර ඒවා අයත් වන විවිධ සංස්කෘතීන් නම් කරන්න.

A ..............................................................................

B ..............................................................................

C ..............................................................................

D .............................................................................. (ලකුණු 04)

(ii) ඉහත සංස්කෘතීන්ට අයත් වන අපේ රටේ පවත්වන උත්සව 01 බැගින් ලියන්න.

A ..............................................................................

B ..............................................................................

C ..............................................................................

D .............................................................................. (ලකුණු 04)

(iii) විවිධ සංස්කෘතීන්ගෙන් යුත් ජන සමාජයක් හඳුන්වන්නේ කුමන නමකින් ද? (ලකුණු 01)

..............................................................................

(iv) එවැනි සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ 03ක් ලියන්න. (ලකුණු 03)

A ..............................................................................

B ..............................................................................

C ..............................................................................

(v) එවැනි සමාජ ක්‍රමයක් තුළ ජීවත් වන මිනිසුන් විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග 04ක් ලියන්න.

A ..............................................................................

B ..............................................................................

C ..............................................................................

D .............................................................................. (ලකුණු 04)

02. (i) බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවා තුන ලියන්න. (ලකුණු 03)

(ii) ප්‍රවාහන සේවයට අදාළ ඉහත දැක්වෙන ලාංඡනය කුමන සේවාවක් නිරූපණය කරන්නේ ද? (ලකුණු 01)



(iii) වර්තමානයේ පොදු ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv) පරිසර සංරක්ෂණය සඳහා රජය මගින් පිහිටුවා ඇති ආයතන දෙකක් ලියන්න. (ලකුණු 02)

(v) පොදු සේවාවක් වන සෞඛ්‍ය සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළ යුතු යුතුකම් 03ක් ලියන්න. (ලකුණු 03)

03. (i) A. නායකයා යනු කවරෙක් ද?
B. අනුගාමිකයා යනු කවරෙක් ද? (ලකුණු 02)

(ii) නායකයකු සතු විය යුතු ගුණාංග 03ක් ලියන්න. (ලකුණු 03)

(iii) වර්තමාන සමාජයේ ගැටුම් අවම කිරීමට මිනිසුන් විසින් ප්‍රගුණ කළ යුතු ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)

(iv) සමාජය තුළින් අපට දක්නට ලැබෙන නායකත්ව අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 03)

04. (i) අනතුරු හා විපත්වල ස්වභාවය අනුව ඒවා ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එම කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ස්වාභාවික ක්‍රියාවලියක් වන ජල ගැලීම් සම්බන්ධයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ජල ගැලීම් ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් | ජල ගැලීම්වලින් සිදුවන හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග |
|---|---|
| 1. .................................................... | 1. .................................................... |
| 2. .................................................... | 2. .................................................... |
| 3. .................................................... | 3. .................................................... |


(ලකුණු 06)

(iii) මාර්ග අනතුරු සිදුවීමට බලපාන මූලික හේතුවක් වන පදිකයන් අතින් සිදුවන වැරදි 03ක් ලියන්න. (ලකුණු 03)

05. (i) විවිධ මාදිලියේ ගැටලු වර්ග 02ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පාසලේ දී ඔබට මුහුණ දීමට සිදුවන පහත දැක්වෙන සටහන සම්පූර්ණ කරන්න.

A




(ලකුණු 06)

(iii) අභියෝග ජයගැනීමට යම් පුද්ගලයෙකු විසින් ප්‍රගුණ කළ යුතු මනෝ සාමාජීය නිපුණතා 03ක් ලියන්න. (ලකුණු 03)

06. කමල් මහතා ''රන්මිණ'' ආයතනයේ සේවා යෝජකයා වන අතර නිමාලි මහත්මිය එම ආයතනයේ සේවා දායකයෙකි. මෙම ආයතනය තුළ ඔවුන් දෙදෙනාම ශ්‍රමාභිමානයෙන් කටයුතු කරති. මෙම ආයතනයට පැමිණෙන දීපාල් මහතා සේවාලාභියෙකි. ඔවුන් ශ්‍රමාභිමානයෙන් කටයුතු කරන නිසා ඔවුන්ට ලබාගත හැකි ප්‍රයෝජන ලැයිස්තුවක් පහත දක්වා ඇත.

A. තම රැකියාව ගැන අභිමානයක් ඇතිවීම.

B. ආයතනය කෙරෙහි මහජන ප්‍රසාදය හිමිවීම.

C. විශ්වාසනීයත්වය ගොඩ නැගීම.

D. සේවක පෙළඹවීම වැඩිවීම.

E. සපයන සේවාව පිළිබඳව සතුටක් ඇතිවීම.

F. තම අවශ්‍යතා පහසුවෙන් ඉටු කරගැනීමට හැකි වීම.

(i) ඉහත තොරතුරු අදාළ කරගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| සේවාදායකයාට ලැබෙන ප්‍රයෝජන | සේවා යෝජකයාට ලැබෙන ප්‍රයෝජන | සේවාලාභියාට ලැබෙන ප්‍රයෝජන |
|---|---|---|
| | | |

(ලකුණු 06)


(ii) යම් ආයතනයක් තුළ සේවය කරන සේවකයෙකුට ලැබෙන අයිතිවාසිකම් 02ක් හා සේවකයින් විසින් ඉටු කළ යුතු යුතුකම් 02ක් ලියන්න.

| යුතුකම් | අයිතිවාසිකම් |
|---|---|
| 1. ........................................................................ | 1. ........................................................................ |
| 2. ........................................................................ | 2. ........................................................................ |

(ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාව තුළ වෘත්තීය පුහුණුව ලබා දෙන ආයතනයක් නම් කරන්න. (ලකුණු 01)

07. (i) පහත සඳහන් උපකාරක පද උපයෝගී කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




*පහළට*

1. මිනිසාට ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය දෙයකි.
2. සමාජයේ කුඩාම ඒකකය මේ නමින් හැඳින්වේ.
3. ආයතනයක සේවකයන් ශ්‍රමාභිමානයෙන් කටයුතු කිරීමෙන් ආයතනයට ලැබෙන ප්‍රයෝජනයකි.
4. වැඩි වශයෙන් කායික ශ්‍රමය වැය කරන රැකියාවකි.
5. මේවායෙහි ඉවුරුවල අනවශ්‍ය ඉදිකිරීම් නිසා ස්වාභාවික විපත් සිදුවේ.
6. අනතුරු හා ආපදාවල දී සහය ලබා ගත හැකි ආයතනයකි.

*හරහට*

7. මෙම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට වර්තමාන රාජ්‍යයන් විශාල උනන්දුවක් දක්වයි.
8. මෙය රැකගැනීම ලෝකවාසී ජනතාවගේ යුතුකමක් මෙන් ම වගකීමක් ද වේ.
9. මෙවන් දිවි පෙවෙතක් ගත කිරීම මිනිසාගේ ආර්ථිකයට යහපත්ය.
10. වර්තමානයේ වඩාත් සාකච්ඡාවට භාජනය වන ''මහ ලෙඩේ'' නමින් ව්‍යවහාරයේ පවතින රෝගය හා සම්බන්ධිත අවයවය වේ.
11. රැකියාවල නිරත වන පුද්ගලයින් වැයකරන ශ්‍රමයේ ප්‍රධාන කොටස් දෙකින් එකකි.

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 8 - 2019

පුරවැසි අධ්‍යාපනය පිළිතුරු පත්‍රය

## I කොටස

01. ජාතික සංවර්ධනය
02. අවුරුදු 18
03. නායකයෙකු
04. නිර්මාණශීලීව
05. ශ්‍රමාභිමානය
06. (✗)
07. (✓)
08. (✓)
09. (✗)
10. (✓)
11. (2)
12. (3)
13. (4)
14. (2)
15. (1)
16. (4)
17. (3)
18. (2)
19. (5)
20. (1)

## II කොටස

(01) (i) A. බෞද්ධ
B. ක්‍රිස්තියානි/ කතෝලික
C. හින්දු
D. ඉස්ලාම්

(ii) A. වෙසක්, පොසොන්, ඇසළ, අවුරුදු උත්සවය
B. නත්තල්, පාස්කු
C. තෛපොංගල්, දීපවාලි, මහා ශිව රාත්‍රී උත්සව
D. රාමසාන්, හජ්ජි, මිලාදුන් නබි උත්සවය

(iii) බහු සංස්කෘතික ජන සමාජය

(iv)
- විවිධ ජන වර්ග ජීවත් වීම.
- විවිධ සිරිත් විරිත් දක්නට ලැබීම.
- විවිධ ආගම් ඇදහීම.
- විවිධ සංස්කෘතික උරුම පැවතීම.
- විවිධ භාෂා කතා කරන ජන කොටස් ජීවත් වීම.

(v)
- සැම ජන වර්ගයකට ම අයත් පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- සැම ජන වර්ගයකට ම අයත් පුද්ගලයින්ට ගරු කිරීම.
- කිසිදු ජන කණ්ඩායමක් හෝ ජන වර්ගයක් උසස් හෝ පහත් කොට නොසැලකීම.
- තම යුතුකම් නොපිරිහෙළා ඉටු කිරීම.
- සැම ජන වර්ගයකම සංස්කෘතික උරුම ආරක්ෂා කිරීම.

02. (i)
- ප්‍රවාහනය
- බැංකු සේවා
- තැපැල් හා විදුලි පණිවුඩ සේවා

(ii) ශ්‍රී ලංකා දුම්රිය සේවය

(iii)
- මාර්ග නඩත්තු හා අලුත්වැඩියා කටයුතු කිරීම.
- අධිවේගී මාර්ග ඉදිකිරීම.
- නව බස්රථ ධාවනයට එක් කිරීම.
- මගී ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීතිමය පියවර ගැනීම.
- නව දුම්රිය මැදිරි හා එන්ජින් ධාවනයට එක් කිරීම.

(iv)
- පරිසර අමාත්‍යාංශය
- මධ්‍යම පරිසර අධිකාරිය
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වන ජීවී දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

(පිටුව 25)

(v)
- වෛද්‍ය උපදෙස් පිළිපැදීම.
- වෛද්‍ය සේවා කාර්ය මණ්ඩලය කෙරෙහි ආචාරශීලී වීම.
- යහපත් සෞඛ්‍ය පුරුදු සම්බන්ධයෙන් අන්‍යයන් දැනුවත් කිරීම.

03. (i) A. කණ්ඩායම් මෙහෙයවන්නා නායකයා වේ.
B. නායකත්වයට අනුව කටයුතු කරන්නා අනුගාමිකයා වේ.

(ii)
- සන්නිවේදන හැකියාව
- මෙහෙයවීමේ හැකියාව
- ගැටලු විසඳීමේ හැකියාව
- සැලසුම් කිරීමේ හැකියාව
- මානව සම්බන්ධතා.... (පිටුව 47)

(iii) අවංකකම, කැපවීම, මානව හිතවාදී බව, සමානාත්මතාව, නිර්මාණශීලී බව, ස්ථිරසාර බව

(iv) ● ආගමික නායකයන්
● ප්‍රජා නායකයන්
● ආයතන ප්‍රධානීන්
● දේශපාලන නායකයන්

04. (i) ස්වාභාවික විපත්
මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත්

(ii) ● ජල ගැලීම් ඇති වීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම්
● වනාන්තර විනාශ කිරීම, වගුරු බිම් ගොඩ කිරීම.
● ගංගාවලින් වැලි ගොඩ දැමීම, පතල් කැණීම
● අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීම.

(iii) ● පාරේ දකුණු පසින් ගමන් නොකිරීම.
● මාර්ග සංඥා හා නීති පිළිබඳ සැලකිලිමත් නොවීම.
● කණ්ඩායම් වශයෙන් ගමන් කිරීම.
● ජංගම දුරකථන භාවිත කරමින් ගමන් කිරීම.
(පිටුව 95)

05. (i) ආර්ථික ගැටලු, මානසික ගැටලු, කායික ගැටලු, පරිසර ගැටලු, තාක්ෂණික ගැටලු, භෞතික ගැටලු

(ii) ● ගැටලුව ඇතිවීමට බලපාන හේතු
● දිනපතා පාසල් නොයෑම, ඉගෙනුම් ක්‍රියාවලියට සූදානම් නොවීම, අවධානය අඩුකම, කැපවීම අඩුකම, අභ්‍යාසවල නොයෙදීම.

ගැටලුව විසඳාගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන
● විෂය සාධන මට්ටම් ඉහළ යාම.
● විෂයට කැමැත්තක් දක්වීම.
● සතුටින් සිටීම.
● ගැටුම් අවම වීම, සාමය ඇතිවීම.

(iii) ● ඵලදායී සන්නිවේදනය
● නිර්මාණශීලී චින්තනය
● ගැටලු විසඳීම.
● අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගීම.
● චිත්තවේග හැසිරවීම.

06. (i) ● සේවාදායකයාට ලැබෙන ප්‍රයෝජන
(A, E)
● සේවා යෝජකයාට ලැබෙන ප්‍රයෝජන
(B, D)
● සේවා ලාභියාට ලැබෙන ප්‍රයෝජන
(C, F)

(ii) ***යුතුකම්***
නියමිත වේලාවට සේවයට පැමිණීම.
සේවා අවශ්‍යතා නොපිරිහෙළා ඉටු කිරීම.
සේවා ස්ථානයේ දේපල ආරක්ෂා කිරීම.
සේවා ස්ථානයේ ගෞරවය ආරක්ෂා කිරීම.

***අයිතිවාසිකම්***
ආරක්ෂිත සේවා ස්ථානයක් වීම.
නිවාඩු ලබා ගැනීමේ වරප්‍රසාද හිමිවීම.
මූලික අවශ්‍යතා සපුරා ගැනීම.
ගෞරවාන්විතව රැකියාව කිරීම.

(iii) වෘත්තීය පුහුණු අධිකාරිය
කාර්මික විද්‍යාල
නැණසල
උසස් තාක්ෂණික ආයතන
(137 පිටුව)

07.

| ***පහළට*** | | ***හරහට*** | |
|---|---|---|---|
| 1. | ජලය | 7. | ළමා |
| 2. | පවුල | 8. | පරිසරය |
| 3. | සංවර්ධනය | 9. | සරල |
| 4. | වඩු | 10. | වකුගඩු |
| 5. | ගං | 11. | මානසික |
| 6. | රතු කුරුස | | |